# ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මහජන පුස්තකාලයන්හි දායකත්වය පිලිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: බස්නාහිර පළාත ඇසුරින්

*එම්.ජී. තාරුක්[1] එම්.ජී.එච්.කේ. විජේරත්න[2]*

ගෝලීය වශයෙන් මානව වර්ගයා දරිද්‍රතාවයේ පීඩාවෙන් නිදහස් කර ගැනීමත්, මිහිකත සුවපත් කිරීමේ අරමුණත් පෙරදැරිව බිහි වූ තිරසර සංවර්ධන ඉලක්ක ලොව සෑම රටක්ම සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමුඛ සංකල්පයකි. මෙහිදී ශ්‍රී ලංකාව තුළ මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථ යතාර්ථයක් කර ගැනීම උදෙසා මෙරට මහජන පුස්තකාල පද්ධතියට තිරසර සංවර්ධනය සඳහා වූ ප්‍රමුඛ මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීමේ හැකියාව පවතී. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා මහජන පුස්තකාලයන්හි දායකත්වය කෙබඳුද? යන ප්‍රස්තුතය පාදක කොටගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදී. තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා මහජන පුස්තකාලවල දායකත්වය කෙබඳුද? යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. තිරසර සංවර්ධන ඉලක්කයන් පිළිබඳව අවබෝධයක් මහජන පුස්තකාලයාධිපතිවරුන් සහ කාර්යමණ්ඩලයට තිබේදැයි හඳුනා ගැනීම, තිරසාර ඉලක්කයන් සාක්ෂාත් කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන පුස්තකාල සේවාවන්හි ගුණාත්මකභාවය අධ්‍යයනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු හා අභියෝග හඳුනා ගැනීම මෙහි සෙසු අරමුණු වේ. මෙහිදි ගුණාත්මක පර්යේෂණ වර්ගය, සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය භාවිතා කරන ලදී. අරමුණු සහගත නියැදියට අනුව බස්නාහිර පළාතේ ප්‍රධාන දිස්ත්‍රික්ක 03 වන කොළඹ,ගම්පහ,කළුතර දිස්ත්‍රික්ක තෝරාගන්නා ලදී. එහිදී එම දිස්ත්‍රික්ක 03හි ප්‍රධාන මහජන පුස්තකාලය බැගින් මහජන පුස්තකාල 03ක් තෝරාගන්නා ලදී. පුස්තකාලයාධිපති හා කාර්යමණ්ඩලය සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හරහා ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. මහජන පුස්තකාලවල වාර්ෂික වාර්තා, වාර්ෂික සැලසුම් වාර්තා හා සමීක්ෂණ ඇසුරින් ද්විතීයික දත්ත රැස් කර ගන්නා ලදී. ජාත්‍යන්තර මට්ටමින් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගනිමින් මහජන පුස්තකාල හරහා ගුණාත්මක වූ පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. නමුත් ශ්‍රී ලංකාව තුළ නිසි ප්‍රමිතීන්ට අනුකූලව ඒකීය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන බවක් දක්නට ලැබේ. තිරසාර ඉලක්කයන් පිළිබඳව නිසි අවබෝධයකින් තොරව සම්ප්‍රදායික වූ පුස්තකාල සේවා මත රැඳෙමින් පුස්තකාල සේවා ක්‍රියාත්මක කරනු ලැබේ. මහජන පුස්තකාල ගත් කළ මව් ආයතනයට යටත්ව ක්‍රියාත්මක වන බවක් දක්නට ලැබේ. එහිදී ප්‍රතිපාදන ලබාදීමේ විෂමතාවයන් දක්නට ලැබීම මෙහි පර්යේෂණ ප්‍රතිපල වේ. මෙලෙස තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගනිමින් මහජන පුස්තකාලවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පුහුණුව පුස්තකාල කාර්යමණ්ඩලයට ලබා දිය යුතුය. මේ සඳහා නිසි නායකත්වයක් සහ නිවැරදි මඟ පෙන්වීමක් මහජන පුස්තකාල පද්ධතියට ලබා දිය යුතු වේ.

***ප්‍රමුඛ පද:*** තිරසර සංවර්ධනය, තිරසර සංවර්ධන ඉලක්කයන්, පුස්තකාල, මහජන පුස්තකාල

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව. erandakaushalya1@gmail.com

[2] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව.